# සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි

# ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට අයත්

# අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන / තාක්ෂණික සේවා ශ්‍රේණිය

# සඳහා වන

# බඳවා ගැනීමේ පරීක්ෂණය.

# (MN 3 2006 ඒ)

(722)


දුරකථන / தொலைபேசி இல. / Telephones: 011-2136600, 011-2136650, 011-2136700
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலை நகல் / Fax: 011-2369305, 011-2369302
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E-mail: info@psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.
இல. 177, நாவல வீதி, நாரஹேன்பிட்ட, கொழும்பு 05.
No. 177, Nawala Road, Narahenpita, Colombo 05.


මගේ අංකය / எனது இல. / My No.: PSC/EST/3/1/13/5/2013

ඔබේ අංකය / உமது இல. / Your No.: 06/H/02/2011

දිනය / திகதி / Date: 2014.04.23

29 APR 2014

25 APR 2014

ලේකම්,

සෞඛ්‍ය අමාත්‍යාංශය.

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවට අයත් අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන / තාක්ෂණ සේවා ගණය (MN-03-2006 (ඒ) තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය.**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබේ සමාංක හා 2014.03.24 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව අනුමත කරන ලද, එම කොමිෂන් සභාවේ ලේකම්ගේ අත්සනින් යුත් උක්ත බඳවා ගැනීමේ පරිපාටියේ මුල් පිටපත මේ සමඟ එවමි.

03. මේ පිළිබඳව අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, අදාළ බඳවාගැනීම් පරිපාටිය ඔබ අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළ කරන ලෙසත් වැඩිදුරටත් දන්වමි.

බී.එම්.බී.එම්.ඒ. බටුගෙදර
සහකාර ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

පිටපත් : 01. ලේකම් - ජාතික වැටුප් කොමිෂන් සභාව (මුල් පිටපත මේ සමග එවමි)

02. ආයතන අධ්‍යක්ෂ ජනරාල්- රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය (මුල් පිටපත මේ සමග එවමි)

දුරකථන / தொலைபேசி இல. / Telephones 011-2136600 011-2136650 011-2136700
ලේකම් / செயலாளர் / Secretary 011-2136602
ෆැක්ස් / தொலை நகல் / Fax 011-2369305 011-2369302
විද්‍යුත් තැපැල / மின் அஞ்சல் / E-mail info@psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website www.psc.gov.lk

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
## அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
## OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.
இல. 177, நாவல வீதி, நாரஹேன்பிட்ட, கொழும்பு 05.
No. 177, Nawala Road, Narahenpita, Colombo 05.

මගේ අංකය / எனது இல. / My No. PSC/EST/3/1/13/5/2013

ඔබේ අංකය / உமது இல. / Your No. 06/H/05/D/2009

දිනය / திகதி / Date 2014.02.20

ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

**<u>ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවට අයත් අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන /තාක්ෂණ සේවා ගණය MN 03 2006 A තනතුරු සඳහා වන බඳවා ගැනීම් පරිපාටි.</u>**

උක්ත කරුණට අදාළව එවා ඇති ඔබේ සමාංක හා 2014.01. දින රහිත ලිපිය හා බැඳේ.

02. එම ලිපිය මගින් ඉදිරිපත් කරන ලද ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවට අයත් අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන /තාක්ෂණ සේවා ගණය MN 03 2006 A තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය ඇමුණුමේ සඳහන් සංශෝධනයන්ට යටත්ව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2014.02.18 දින අනුමත කර ඇති අතර, එම සංශෝධන අනුව සකස් කළ බඳවාගැනීම් පරිපාටියේ මුල් පිටපත් 05 ක් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අත්සන සඳහා ඉදිරිපත් කරන ලෙස කාරුණිකව දන්වමි.

බී.එම්.බී.එම්.ඒ. බටුගෙදර
සහකාර ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

පිටපත් : 1) ලේකම් - ජාතික වැටුප් කොමිෂන් සභාව.

2) ආයතන අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

**සෞඛ්‍ය අමාත්‍යාංශයෙ හි**

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවට අයත්**

**අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන / තාක්ෂණික සේවා ගණය**

**(MN- 3 -2006(ඒ)) තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය)**

**01. සම්බන්ධ වන ආයතන**

| | | | |
|---|---|---|---|
| 1.1 | දෙපාර්තමේන්තුව : | අදාළ නොවේ. | |
| 1.2 | අමාත්‍යාංශය : සෞඛ්‍ය | යොමු අංකය : 06/ H /02/2011 | දිනය :2013.02.08 |
| 1.3 | කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම | යොමු අංකය : DMS/C/08/45 | දිනය:2012.05.10 |
| | | යොමු අංකය : DMS/CI/H&N/ C-VOL.ii | දිනය:2013.05.10 |
| 1.4 | ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය | යොමු අංකය : Est-2/RECRU/ 02/0234 | දිනය:2012.02.24 |
| 1.5 | ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය | යොමු අංකය : NSCC/4/13/SR-6. | දිනය:2013.01.31 |
| 1.6 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය: | යොමු අංකය : PSC/EST/3/1/13/5/2013 | දිනය:2014.02.18 |

**02. පත් කිරීම් බලධරයා :** රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද සෞඛ්‍ය ලේකම්

**03. සේවා ගණය පිළිබඳ විස්තර**

3.1 **සේවා ගණය :** අධීක්ෂණ කළමණාකරණ සහකාර තාක්ෂණ

29 APR 2014

3.2 **ශ්‍රේණි** : III , II හා I

3.3 **පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :** සෞඛ්‍ය ආයතන හා රෝහලවල විධායකයේ කාර්යයන්ට උපස්තම්භක වන යේ විධායකය විසින් නියමිත කොට පවරනු ලබන පිරිස් පාලනය, ඖෂධ භාරකාරත්වය හා පරිහරණය, ශල්‍ය ද්‍රව්‍ය හා උපකරණ යන්ත්‍ර පරිහරණය, අධීක්ෂණය හා නඩත්තු කිරීම් පිළිබඳ කාර්යයන්හි ඇතුලත් රෝග නිවාරණය හෝ රෝගී සත්කාරය සඳහා ඍජු හෝ වක්‍ර ලෙස පරිපූරක වන්නා වූ, විද්‍යාත්මක මූලධර්ම මත සංවිධානය වූ ප්‍රායෝගික විෂයයන් හා සම්බන්ධ තාක්ෂණ ඥානය පිළිබඳව පුහුණුව ලබා ගත යුතු බහු කාර්ය ස්වරූපයේ කාර්යන් ඉටු කරන නිලධර ගණයකි.

3.4 **කාර්යයන් පැවරීම :** ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාවය පදනම් කොටගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

**04. තනතුරෙහි / තනතුරුවල ස්වභාවය :** ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත

## 05. වැටුප්

5.1 වැටුප් කේත අංකය : MN 3-2006 ඒ

5.2 වැටුප් පරිමාණය

(අ) MN 3-2006 ඒ - රු.15,005 - 4 x 180 -6 x 240 -11 x 320 -20 x 360-27,885

(රජය විසින් කලින් කලට අනුමත කරනු ලබන වැටුප් චක්‍රලේඛ අනුව වැටුප් පියවරයන් වෙනස් විය හැක.)

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| III | MN 3-2006 ඒ පියවර 01 | රු: 15,005/- |
| II | MN 3-2006 ඒ පියවර 12 | රු: 17,485/- |
| I | MN 3-2006 ඒ පියවර 23 | රු: 21,045/- |

5.4 පුහුණු කිරීමේ ශ්‍රේණියේ දීමනාව : රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 (II) අනුව ගෙවනු ලැබේ.

## 06. සේවා ගණයට අයත් තනතුර /තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනු අංකය | අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|---|
| 01. | ඖෂධ සංයෝජක | III, II,හා I | 107 | ඇමුණුම 01 |
| 02. | මහජන සෞඛ්‍ය ක්ෂේත්‍ර නිලධාරී | III, II,හා I | 17 | |
| 03. | වැඩ මුලික (ජීව වෛද්‍ය ) | III, II,හා I | 94 | |
| 04. | විකලාංග වැඩපල කාර්මික ශිල්පී | III, II,හා I | 09 | |
| 05. | ශ්‍රවණවේදී කාර්මික ශිල්පී | III,II,හාI | 28 | |
| 06. | විද්‍යුත් නඩත්තු කාර්මික ශිල්පී | III, II,හා I | 01 | |
| 07. | සිනමා තාක්ෂණ ශිල්පී | III, II,හා I | 02 | |

## 6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :-

| අනු අංකය | අනුමත තනතුරු නාම | අනුමත තනතුරු සංඛ්‍යාව |
|---|---|---|
| 1. | ඖෂධ සංයෝජක | 107 |
| 2. | මහජන සෞඛ්‍ය ක්ෂේත්‍ර නිලධාරී | 17 |
| 3. | වැඩ මුලික (ජීව වෛද්‍ය) | 94 |
| 4. | විකලාංග වැඩපල කාර්මික ශිල්පී | 09 |
| 5. | ශ්‍රවණවේදී කාර්මික ශිල්පී | 28 |
| 6. | විද්‍යුත් නඩත්තු කාර්මික ශිල්පී | 01 |
| 7. | සිනමා තාක්ෂණ ශිල්පී | 02 |

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීම සඳහා III, II, I ශ්‍රේණි ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් යේ සැලකේ.

# බඳවා ගැනීමේ ක්‍රමය

## 7.1 බඳවා ගන්නා අනුපාතය

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 70% |
| සීමිත | 30% |
| කුසලතා | අදාළ නොවේ |

සටහන:-

I. III, II, I යන ශ්‍රේණින්හි ඒකාබද්ධ සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු තනතුරු ප්‍රමාණයෙන් 70% ක් බාහිර අයදුම්කරුවන් සඳහා වන විවෘත තරඟ විභාගයකින් සම්පූර්ණ කෙරේ.

II. සීමිත තරඟ විභාගයෙන් බඳවා ගැනීමට නියමිත ප්‍රතිශතය සඳහා ප්‍රමාණවත් මූලික සුදුසුකම් සහිත අභ්‍යන්තර අයදුම්කරුවන් අදාළ දෙපාර්තමේන්තුව/අමාත්‍යාංශය තුළ නොසිටී නම් පමණක් ඉතිරි ප්‍රමාණය විවෘත තරඟ විභාගය මගින්ම තෝරා ගන්නා බාහිර අයදුම්කරුවන්ගෙන්ම සම්පූර්ණ කර ගත හැකිය.

III. පුරප්පාඩු සංඛ්‍යාව 03ට අඩු නම් බඳවා ගනු ලබන්නේ විවෘත ධාරාව යටතේ පමණි.

## 7.2 විවෘත බඳවා ගැනීම

### 7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය :

| අනු අංකය | තනතුර | බඳවා ගන්නා ශ්‍රේණිය |
|---|---|---|
| 01. | ඖෂධ සංයෝජක | පුහුණු ශ්‍රේණිය |
| 02. | මහජන සෞඛ්‍ය ක්ෂේත්‍ර නිලධාරී | පුහුණු ශ්‍රේණිය |
| 03. | වැඩ මූලික (ඡට වෛද්‍ය) | III ශ්‍රේණිය/පුහුණු ශ්‍රේණිය |
| 04. | විකලාංග වැඩපල කාර්මික ශිල්පී | III ශ්‍රේණිය |
| 05. | ශ්‍රවණවේදී කාර්මික ශිල්පී | පුහුණු ශ්‍රේණිය |
| 06. | සිනමා තාක්ෂණ ශිල්පී | III ශ්‍රේණිය |
| 07. | විදුලි නඩත්තු කාර්මික ශිල්පී | III ශ්‍රේණිය |

සටහන:

I. III වන ශ්‍රේණියට සෘජුව බඳවා ගැනීම සහ පුහුණු ශ්‍රේණියට බඳවා ගැනීම යන ක්‍රම දෙකින්ම බඳවා ගන්නා විට බඳවා ගැනීමේ ශ්‍රේණිය වන III වන ශ්‍රේණියට පළමුව බඳවා ගත යුතුය.

II. III වන ශ්‍රේණියට සුදුසුකම් ලබන අයදුම්කරුවන් සංඛ්‍යාව පුරප්පාඩු සංඛ්‍යාවට ප්‍රමාණවත් නොවන විට, ඉතිරි පුරප්පාඩු සඳහා පුහුණු ශ්‍රේණියට අදාළ සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුළත් කරගනු ලැබේ.

### 7.2.2 සුදුසුකම් :

7.2.2.1 **අධ්‍යාපන සුදුසුකම්** : එක් එක් තනතුරට අදාළ වන සුදුසුකම් ඇමුණුම 02 දැක්වේ.

7.2.2.2 **වෘත්තීය සුදුසුකම්** : එක් එක් තනතුරට අදාළ වන සුදුසුකම් ඇමුණුම 02 දැක්වේ.

7.2.2.3 **පළපුරුද්ද** : අදාළ නොවේ.

7.2.2.4 **කායික සුදුසුකම්** : ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.2.2.5 **වෙනත්** : i. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

ii. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

iii. සේවයට බඳවා ගැනීම සඳහා වන තරඟ විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාල සියළු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

7.2.3 **වයස** :

7.2.3.1 **අවම සීමාව** : අවුරුදු 18 ට නොඅඩු

7.2.3.2 **උපරිම සීමාව** : අවුරුදු 30 ට නොවැඩි

7.2.4 **බඳවා ගැනීමේ ක්‍රමය :**

7.2.4.1 **ලිඛිත විභාගය**

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1.බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| 2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | 100 | 40% |

සටහන: ලිඛිත විභාගය පිළිබඳ විස්තර ඇමුණුම - 04 හි ඇත.

7.2.4.1.1 **පවත්වන බලධරයා :** සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

7.2.4.2 **වෘත්තීය පරීක්ෂණය:** අදාළ නොවේ.

7.2.4.3 **සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය (ලකුණු ලබා දෙනු නොලැබේ.)**

**ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු** : කායික යෝග්‍යතාව හා සුදුසුකම් පරීක්ෂා කිරීම.

7.2.4.3.1 **සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය : සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් පත්කරනු ලබන බලධරයා**

7.2.4.4 **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :** අදාළ නොවේ.

7.2.5 **අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :** රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළ කිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීම සහ වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.3 **සීමිත බඳවා ගැනීම්**

7.3.1 **බඳවා ගන්නා ශ්‍රේණිය :**

| අනු අංකය | තනතුර | බඳවා ගන්නා ශ්‍රේණිය |
|---|---|---|
| 01 | ඖෂධ සංයෝජක | පුහුණු ශ්‍රේණිය |
| 02 | මහජන සෞඛ්‍ය ක්ෂේත්‍ර නිලධාරී | පුහුණු ශ්‍රේණිය |
| 03 | වැඩ මූලික (ජීව වෛද්‍ය) | III ශ්‍රේණිය/පුහුණු ශ්‍රේණිය |
| 04 | විකලාංග වැඩපළ කාර්මික ශිල්පී | III ශ්‍රේණිය |
| 05 | ශ්‍රවණවේදී කාර්මික ශිල්පී | පුහුණු ශ්‍රේණිය |

සටහන:

I. III වන ශ්‍රේණියට සෘජුව බඳවා ගැනීම සහ පුහුණු ශ්‍රේණියට බඳවා ගැනීම යන ක්‍රම දෙකින්ම බඳවා ගන්නා විට බඳවා ගැනීමේ ශ්‍රේණිය වන III වන ශ්‍රේණියට පළමුව බඳවා ගත යුතුය.

II. III වන ශ්‍රේණියට සුදුසුකම් ලබන අයදුම්කරුවන් සංඛ්‍යාව පුරප්පාඩු සංඛ්‍යාවට ප්‍රමාණවත් නොවන විට, ඉතිරි පුරප්පාඩු සඳහා පුහුණු ශ්‍රේණියට අදාළ සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුළත් කරගනු ලැබේ.

7:3:2 **සුදුසුකම් :**

7.3.2.1 **අධ්‍යාපන සුදුසුකම්** : එක් එක් තනතුරට අදාළ වන සුදුසුකම් ඇමුණුම 03 හි දැක්වේ.

7.3.2.2 **වෘත්තීය සුදුසුකම්** : එක් එක් තනතුරට අදාළ වන සුදුසුකම් ඇමුණුම 03 හි දැක්වේ.

7.3.2.3 **පළපුරුද්ද** : එක් එක් තනතුරට අදාළ වන සුදුසුකම් ඇමුණුම 03 හි දැක්වේ.

7.3.2.4 **කායික සුදුසුකම්** : ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.3.2.5 **වෙනත්** :
i. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
ii. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
iii. සේවයට බඳවා ගැනීම සඳහා වන තරඟ විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාළ සියළු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

7.3.3. වයස: අදාළ නොවේ.

**7.3.4 බඳවා ගැනීමේ ක්‍රමය :**

7.3.4.1 **ලිඛිත විභාගය** :

| **විෂයයන්** | **උපරිම ලකුණු ප්‍රමාණය** | **සමත් ලකුණු ප්‍රමාණය** |
|---|---|---|
| 1.බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| 2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | 100 | 40% |

සටහන :- අදාළ විස්තර ඇමුණුම 05 හි ඇත.

**7.3.4.1.1 පවත්වන බලධරයා** : සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

**7.3.4.1.2 වෘත්තීය පරීක්ෂණය** : අදාළ නොවේ.

7.3.4.2 **සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය (ලකුණු ලබා දෙනු නොලැබේ.)**

**ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු** : කායික යෝග්‍යතාව සහ සුදුසුකම් පරීක්ෂා කිරීම

7:3:4:2:1 **සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය**

**පත් කරනු ලබන බලධරයා** : සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්

7.3.4.3 **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය** : අදාළ නොවේ.

7:3:5 **අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :** රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළ කිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීම සහ වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ

7.4 **කුසලතා පදනම මත බඳවා ගැනීම :** අදාළ නොවේ.

7.5 **පුහුණු කිරීමේ ශ්‍රේණිය අවසානයේදී III ශ්‍රේණියට බඳවා ගන්නා ආකාරය :**

i. විවෘත ධාරාව හෝ සීමිත ධාරාව හෝ යටතේ පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුළත් කරගනු ලබන අයදුම්කරුවන් අදාළ බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් පුහුණු කාලසීමාව සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් අනතුරුව සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන විභාගය සමත් බවට නිකුත් කරනු ලබන සහතිකය ඉදිරිපත් කිරීමෙන් පසු සේවයේ III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

ii. පුහුණුව අවසානයේ පවත්වනු ලබන විභාගය සමත් වීමට අපොහොසත් වන ආධුනිකයින් වෙතොත් ඔවුන්ට මාස 06කට නොවැඩි කාලයක් සඳහා සිය පුහුණු කාලය දීර්ඝ කරවා ගැනීමට අවස්ථාව ඇත. එසේ දීර්ඝ කරනු ලබන කාල සීමාව අවසානයේ නැවත පවත්වනු ලබන විභාගය අසමත් වන විවෘත ධාරාව යටතේ අයදුම්කළ ආධුනිකයන්ගේ සේවය අවසන් කරනු ලබන අතර සීමිත ධාරාව යටතේ අයදුම් කල ආධුනිකයින් ඔවුන්ගේ පූර්ව තනතුරුවලට මුදා හැරේ.

iii. දෙවසරකට වඩා වැඩි පුහුණුවක් අවශ්‍ය යම් විශේෂ තනතුරු වෙතොත් එම අතිරේක පුහුණු කාලයන් සඳහා අතිරේක පුහුණු කාලයේ එක් වසරක් වෙනුවෙන් එක් වැටුප් වර්ධකයක් බැගින් ලබාදීමේ පදනම මත පුහුණුව අවසානයේ III ශ්‍රේණියට බඳවා ගනු ලබන අතර, අතිරේක පුහුණු කාලසීමාව II ශ්‍රේණියට උසස් කිරීම සඳහා සලකා බලනු ලබන කාලසීමාවට ගණන් ගනු ලැබේ.

iv. සීමිත ධාරාව යටතේ තෝරාගත් ආධුනිකයින් පුහුණු කිරීමේ ශ්‍රේණියේදී තමන් කලින්දැරූ වැටුප් පරිමාණයේම තවදුරටත් රැඳී සිටිය යුතු අතර, පුහුණු පාඨමාලාව අවසානයේ දෙපාර්තමේන්තුව විසින් පවත්වන විභාගය සමත් වන තුරු ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ බඳවා ගැනීම් ශ්‍රේණියේ ආරම්භක වැටුප් වර්ධකයට සමාන වාර්ෂික දීමනාවක් වැටුපට අමතරව ගෙවනු ලැබේ. පුහුණු කාල සීමාව සතුටුදායක ලෙස ගත කරන නිලධාරියකු දෙවන වසරේදී තමන් මෙතෙක් සිටි වැටුප් පරිමාණයේම ඉහළ වැටුප් පියවරේ පිහිටුවනු ලබන අතර, දීමනාව තව දුරටත් ගෙවනු ලැබේ. පුහුණුව සතුටුදායක ලෙස සම්පූර්ණ කොට විභාගය සමත් වීමෙන් පසු 2000.03.02 දිනැති අංක 07/2000 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් සංශෝධිත ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව වැටුප් පරිවර්ථනය කරනු ලැබේ.

**08. කාර්යක්ෂමතා කඩඉම් :** ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුව විය යුතුය.

**09. භාෂා ප්‍රවීණතාවය :** ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුව විය යුතුය.

**10. ශ්‍රේණි උසස් කිරීම :** ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුව විය යුතුය.

සටහන: 1 වන හා 2 වන දෙපාර්තමේන්තු පරීක්ෂණ සඳහා අදාළ වන විෂය නිර්දේශයන් ඇමුණුම 06 හා ඇමුණුම 07 මගින් දක්වා ඇත.

**11. තනතුරු වලට පත් කිරීම :** අදාළ නොවේ.

**12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වල දැක්වෙන කොන්දේසි වලට පරබාහිර වන්නා වූ කොන්දේසි :** මෙම බඳවා ගැනීමේ පරිපාටියෙහි සඳහන් කොන්දේසි වලට අමතරව ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවෙහි සඳහන් විධිවිධාන සහ කොන්දේසි ද අදාළවේ.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරබාහිර වන්නා වූ අර්ථ නිරූපණය :

**"සක්‍රිය සේවා කාලය"** යනු ස්වකීය තනතුරට අදාල වැටුප් ලබමින් , සත්‍ය වශයෙන්ම රාජකාර්යෙහි යෙදී සිටි කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනිකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

14. **සේවයේ යෙදී සිටින්නන් අන්තර්ග්‍රහණය කිරීම :** ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුව විය යුතුය.

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීති වල දැක්වෙන පොදු කොන්දේසි සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

16. මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වේනම් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

සකස් කළේ අත්සන : ...........

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම : එච්.ඒ.රී.සෝමරත්න

තනතුර : වැ/බ.අධ්‍යක්ෂ (පාලන) 06

දිනය : 2014.03.21

පරීක්ෂා කළේ අත්සන : ...........

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම : කේ.ටී.ඩී.සී.විමලසිරි

තනතුර : වැ/බ.නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන)I

දිනය : 2014.03.21

නිර්දේශකර ඉදිරිපත් කරමි.

අත්සන : ...........

(දෙපාර්තමේන්තු ප්‍රධාන )

නම : වෛද්‍ය පී.ජී.මහීපාල

තනතුර : සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

නිල මුද්‍රාව : ...........

දිනය : 2014/03/23

යොමු අංකය : 06/H/02/2011

සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට අයත් MN - 03 වැටුප් ක්‍රමයට අදාළ තනතුරු සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම සඳහා නිර්දේශ කරමි.

අත්සන : ...........

: වෛද්‍ය වයි.ඩී. නිහාල් ජයතිලක

ලේකම්

සෞඛ්‍ය අමාත්‍යාංශය

(මුද්‍රාව: වෛද්‍ය වයි. ඩී. නිහාල් ජයතිලක, ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය, කොළඹ 10.)

දිනය : 24/03/2014

නිල මුද්‍රාව : ...........

යොමු අංකය : PSC/EST/3/1/13/5/2013

සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට අයත් MN - 03 තනතුරු සඳහා වන මෙම බඳවා ගැනීමේ පරිපාටිය 2014 - 02 - 18 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන : ...........

නම : ...........

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 2014 04 23

නිල මුද්‍රාව : ...........

ටී. එම්. එල්. සී. සේනාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංකය. 177, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ-05.

ඇමුණුම -01
සෞඛ්‍ය අමාත්‍යාංශයෙ හි
ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවට අයත්
අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන / තාක්ෂණික සේවා ගණයේ
තනතුරු වලට පැවරි ඇති කාර්යයන්

| අනු අංකය | අනුමත තනතුරු නාම | කාර්යයන් |
|---|---|---|
| 01. | ඖෂධ සංයෝජක | • වෛද්‍ය නිලධාරි විසින් නිර්දේශිත ඖෂධ වට්ටෝරුවල ඇතුළත් සියළුම ඖෂධ වර්ග රෝගීන් සඳහා නිකුත් කිරීම හා රෝගීන්ට ඖෂධ පිළිබඳ නිසි උපදෙස් ලබාදීම.<br>• රෝගීන් සඳහා අවශ්‍ය අභ්‍යන්තරික සංයෝජන හා බාහිර ආලේපන වර්ග අදාල ප්‍රමිතීන්ට අනුව සකස් කර නිකුත් කිරීම.<br>• ඖෂධ වට්ටෝරු අනුව ඇස්, කන්, නාසය සඳහා වූ දියර සහ බින්දු වර්ග ආදිය ඖෂධ ප්‍රමිතීන්ට අනුව සකස් කර නිකුත් කිරීම.<br>• නිවැරදි ප්‍රමිතීන්ට අනුකූලව සාන්ද්‍රණගත විෂබීජ නාශක දියර ආදිය සකස් කර රෝහලේ වාට්ටු සැරහුම් කාමර, ශල්‍ය කාමර, ආදී අනිකුත් අංශ වෙත නිකුත් කිරීම.<br>• ඖෂධ, ශල්‍ය ද්‍රව්‍ය, සැරහුම් ද්‍රව්‍ය, උපකරණ, වාට්ටු සැරසුම් කාමර,ශල්‍ය කාමර හා අනෙකුත් අංශ වෙත නිකුත් කිරීම.<br>• සුවඳ විලවුන් හා ඖෂධ පනතේ 3 වන උපලේඛණයේ සඳහන් අන්තරායකර ඖෂධ ගබඩා කිරීමේ හා පරිහරණය කිරීමේ කටයුතු අවශ්‍ය පරිදි සිදු කිරීම.<br>• ඖෂධ, ශල්‍ය හා සැරහුම් ද්‍රව්‍ය ලබා ගැනීම හා නිකුත් කිරීමේ ලේඛණ දෛනිකව පවත්වා ගෙන යාම හා එම ද්‍රව්‍යයන්හි තොග පිළිබඳව වගකීම සාජු ලෙස දැරීම.<br>• ඖෂධ තොගවල ගබඩාකරණය පිළිබඳ සෘජු වගකීම දැරීම, ගබඩා තත්වයන් නිසි ලෙස පවත්වා ගෙන යාම හා එය දෛනිකව අධීක්ෂණය කිරීම.<br>• ආයතනයේ වාර්ෂික ඖෂධ ශල්‍ය හා සැරහුම් ඇස්තමේන්තු පිළියෙළ කිරීම සඳහා ආයතන ප්‍රධානියාට සහාය වීම.<br>• ආයතනික ඖෂධ සමාලෝචන කමිටුව සඳහා සාමාජිකයෙකු ලෙස පත්කළහොත් සහභාගී වීම හා එහිදී අදාළ සංඛ්‍යා ලේඛණ දත්ත සැපයීම, ඒවා නිසි ලෙස පවත්වා ගෙන යාම.<br>• ඖෂධ අපහරණ කටයුතු සඳහා සාජු ලෙස අදාළ මණ්ඩල වෙත සහාය ලබාදීම හා කල් ඉකුත් වූ ඖෂධ පරිහරණය, අවම ඖෂධ පරිහරණය, අවම ඖෂධ, කල් ඉකුත්වීමට ආසන්න ඖෂධ පිළිබඳව වාර්තා අදාල අංශ වෙත නිවැරදිව සැපයීම.<br>• ඖෂධ ශාලාවේ සාමාන්‍ය හා ශල්‍ය වට්ටෝරු ගත ලේඛණ නිසි ලෙස පවත්වා ගෙන යාම, තොග භාණ්ඩ සමීක්ෂණ කටයුතු වලදී අදාල මණ්ඩල වෙත ඒ සඳහා සහයෝගය ලබා දීම.<br>• රෝගීන්ට ඖෂධ භාවිතය, ඖෂධ වල අතුරු ප්‍රතිඵල ආදි කරුණු පිළිබඳව දැනුම ලබා දීම. |

| | | |
|---|---|---|
| 02. | මහජන සෞඛ්‍ය ක්ෂේත්‍ර නිලධාරී | • රෝගාශ්‍රිත ප්‍රදේශ සිතියම්ගත කිරීම, විද්‍යාත්මක ක්‍රම භාවිතා කරමින් ඉදිරි වැඩසටහන් පිළියෙළ කිරීම සහ ප්‍රාදේශීය නිලධාරී (මැලේරියා මර්දන/බරවා මර්දන) හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් අනුමත කරන ලද ඉදිරි වැඩ සටහනට අනුව ක්ෂේත්‍ර කටයුතුවල නිරත වීම.<br>• සංඛ්‍යා ලේඛණ වාර්තා හා වෙනත් අදාළ ලිපි ලේඛණ නඩත්තු කිරීම, විශ්ලේෂණය කිරීම හා අධීක්ෂණ නිලධාරීන් වෙත යැවිය යුතු වාර්තා, ලේඛණ ආදිය නියමිත කාලසීමාව තුළ යොමු කිරීම.<br>• රුධිර පටල ලබාගැනීම හා සුරක්ෂිතව රසායනාගාරය වෙත යැවීම.<br>• සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන් වලට සහයෝගය ලබාදීම හා රෝග මර්දන වැඩසටහන් සඳහා ස්වේච්ඡා සංවිධාන, පාසැල් හා රාජ්‍ය නොවන සංවිධාන සමඟ සම්බන්ධීකරණ කටයුතු ඉටු කිරීම.<br>• ගෘහස්ථ ශේෂ කෘමිනාශක ඉසීම් , අවකාශ ඉසීම් හා කීට නාශක ඉසීම් නියමිත ප්‍රමිතියට අනුව කරවීම හා එම කණ්ඩායම් අධීක්ෂණය කිරීම, ඒ සඳහා යොදාගන්නා උපකරණ සූදානම් කරවීම නඩත්තුව සහ අළුත්වැඩියාවන් කරවීම, එම උපකරණ හා කෘමිනාශක නියමිත උපදෙස් හා තාක්ෂණික නියමයන්ට අනුව ගබඩා කිරීම, නිකුත් කිරීම හා ලේඛණ නඩත්තු කිරීම.<br>• වාහකයන් බෝවන ස්ථාන හඳුනා ගැනිමට හා ඒවා පාලනය කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.<br>• ක්ෂේත්‍ර සමීක්ෂණ කටයුතු කිරීම, රෝගීන්ගෙන් හෝ රෝගීන් යැයි සැක කරන පුද්ගලයන්ගෙන් රුධිර සාම්පල ලබා ගැනීම, රසායනාගාර වෙත අනුමත ක්‍රියාදාමයට අනුව සුරක්ෂිතව යැවීම, ඔවුන්ට ප්‍රතිකාර හෝ / හා අවශ්‍ය උපදෙස් ලබාදීම සහ අදාල රෝගීන් පිළිබඳ පසු විපරම් කටයුතු සිදු කිරීම.<br>• වෛද්‍ය ආයතන කරා පැමිණෙන රෝගීන්ගේ රුධිර පටල ලබාගැනීමට ක්‍රියා කිරීම සහ වෛද්‍යවරුන් නියම කරන ආකාරයට ප්‍රතිකාර නිකුත් කිරීම.<br>• කීට විද්‍යා සමීක්ෂණ කණ්ඩායම්වලට අනුයුක්ත කර ඇති විට අදාල රාජකාරීවල නිරතවීම.<br>• රෝගීන් සොයා ගැනීමේ විකල්ප ක්‍රම පවරන ලද අවස්ථාවලදී ඒවා ක්‍රියාත්මක කිරීම.<br>• අධීක්ෂණ නිලධාරියා/ නිලධාරීන් විසින් පවරනු ලබන වෙනත් ඕනෑම අදාළ රාජකාරියක් වගකීමෙන් යුතුව ඉටු කිරීම. |
| 03. | වැඩ මූලික (ජව වෛද්‍ය) | • වෛද්‍ය උපකරණ ස්ථාපනය කිරීම, ආදර්ශනය කිරීම (demonstration), අළුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම හා අපහරණය කිරීම.<br>• කාර්මික ශිල්පීන් ඇතුළු කණිෂ්ඨ කාර්ය මණ්ඩල අධීක්ෂණය කිරීම.<br>• අංශයට අදාළ මිනුම් උපකරණ, ආයුධ, කාර්යාලීය උපකරණ ආදිය (inventory Items) භාරයේ තබා ගැනීම.<br>• ලේඛණ කටයුතුවල නියැලීම, අමතර කොටස් ඇණවුම් කිරීමට අදාළ කටයුතු කිරීම.<br>• තාක්ෂණික ඇගයුම් කමිටුවල සමාජිකත්වය දැරීම.<br>• ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන වෙනත් රාජකාරී. |

| | | |
|---|---|---|
| 04. | විකලාංග වැඩපල කාර්මික ශිල්පී | • වැඩපල කළමනාකරු විසින් නියම කරනු ලබන ආකාරයට ප්‍රශ්ලේෂණ (ප්‍රොස්තිසිස්) සහ යථා කරණ සහ අනෙකුත් කාර්මික උපකරණ සම්බන්ධයෙන් රෝගීන්ගෙන් මැනුම් ලබාගෙන එම උපකරණ ඔවුන්ට සවි කිරීම.<br>• රෝගීන්ගේ ප්ලාස්ටර් අච්චු ලබාගෙන ඒවා සඳහා අවශ්‍ය වෙනස් කිරීම් සිදු කිරීම.<br>• රෝගීන්ට උපකරණ සවිකොට අත්හදා බැලීම් සිදු කිරීම සහ ඒවා ක්‍රියාත්මක වශයෙන් සහ බාහිර වශයෙන් ප්‍රශස්ත ලෙස ගැලපෙන අයුරින් මනාව නිපදවා ඇති බවට සහතික කිරීම සඳහා සවිකරනු ලබන උපකරණ සම්බන්ධයෙන් ඉතාම නිවැරදි ගැලපීම් ලබා ගැනීම.<br>• වැඩ සම්බන්ධ රූපසටහන් සහ අදාල කාර්මික උපදෙස් පරිදි රෝගීන්ට අවශ්‍ය පුහුණුව ලබාදීම.<br>• සවිකරන ලද විවිධ උපකරණ භාවිතය පිළිබඳව රෝගීන්ට අවශ්‍ය පුහුණුව ලබාදීම.<br>• කාර්ය මණ්ඩලයේ රාජකාරි වැඩකටයුතු පිළිබඳව අධීක්ෂණ කටයුතු කිරීම නිරීක්ෂණය කිරීම.<br>• සියළු රාජකාරි, වැඩකටයුතු පිළිබඳව සටහන් පත්‍ර, ලිපිලේඛණ, භාණ්ඩ ලේඛණ යථා පරිදි පවත්වාගෙන යාම.<br>• විකලාංග ශල්‍ය වෛද්‍යවරුන් විසින් නියම කරනු පරිදි රෝගීන්ගේ උපකරණ අලුත්වැඩියා කරදීම හා ද්‍රව්‍ය නිකුත් කිරීම.<br>• ද්‍රව්‍ය ඇණවුම් කිරීම සඳහා ගබඩාභාරකරුට අවශ්‍ය උපදෙස් ලබාදීම.<br>• සේවකයන්ට සිදුවිය හැකි හදිසි අනතුරු වලක්වාලීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.<br>• ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන වෙනත් රාජකාරි. |
| 05. | ශ්‍රවණවේදී කාර්මික ශිල්පී | • ශ්‍රවණ පරීක්ෂා කිරීම.<br>• ශ්‍රවණ සහ සමතුලිතතාවය පිළිබඳ පරීක්ෂා කිරීම.<br>• ශ්‍රවණ ආධාරකය සවි කිරීම.<br>• ශ්‍රවණ වහල් බව පිළිබඳ දැනුම හා එය සවි කිරීමට අවශ්‍ය දැනුම.<br>• එම උපකරණ වල අළුත්වැඩියා සහ සවි කිරීම.<br>• නඩත්තු හා ප්‍රමාණ ශෝධනය.<br>• ශ්‍රවණ ආධාරක භාවිතා කිරීම.<br>• කර්ණ අච්චු සෑදීම හා සවි කිරීම.<br>• ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන වෙනත් රාජකාරි. |
| 06. | සිනමා තාක්ෂණ ශිල්පී | • සිනමා උපකරණ ස්ථාපනය කිරීම, ආදර්ශනය කිරීම (demonstration) , අළුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම හා අපහරණය කිරීම.<br>• කාර්මික ශිල්පීන් ඇතුළු කණිෂ්ඨ කාර්ය මණ්ඩල අධීක්ෂණය කිරීම.<br>• අංශයට අදාල උපකරණ, කාර්යාලීය උපකරණ ආදිය (inventory Items) භාරයේ තබා ගැනීම.<br>• ලේඛණ කටයුතුවල නියැලීම, අමතර කොටස් ඇණවුම් කිරීමට අදාල කටයුතු කිරීම.<br>• තාක්ෂණ ඇගයුම් කමිටුවල සමාජිකත්වය දැරීම. ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන වෙනත් රාජකාරි. |

| | | |
|---|---|---|
| 07. | විද්‍යුත් නඩත්තු කාර්මික ශිල්පී | • ආයතනයේ විවිධ නඩත්තු කටයුතු සතුටුදායක ලෙස පවත්වා ගැනීම.<br>• ප්‍රධාන වායු සමීකරණ පද්ධතිය දිනපතා ක්‍රියාත්මක කිරීම හා පරීක්ෂා කිරීම.<br>• නඩත්තු කටයුතු සම්බන්ධව පරීක්ෂා කිරීම හා සුළු අළුත්වැඩියා කටයුතු ඉටුකිරීම.<br>• විදුලි හා ජල සැපයීම සම්බන්ධව සුළු නඩත්තු කටයුතු හා අළුත්වැඩියා කිරීම.<br>• පරීක්ෂණාගාරයේ යන්ත්‍රවල හා ගොඩනැගිල්ලේ සුළු අළුත්වැඩියා අවශ්‍ය පරිදි ඉටුකිරීම.<br>• ගොඩනැගිලි අළුත්වැඩියා කටයුතු කිරීම.<br>• ආයතන මගින් අත්සන් කරන ලද ගිවිසුම් අනුව යන්ත්‍ර උපකරණ නිසිපරිදි ක්‍රියාකිරීම පවත්වා ගැනීම. (විදුලි සෝපාන, විදුලි ජනක යන්ත්‍ර, ස්ථාපිත වායු සමීකරණ යන්ත්‍ර, ගිනි නිවීමේ පද්ධති යනාදිය)<br>• ගිනි ආරක්ෂණ පද්ධතියේ විදුලි සීනු පරීක්ෂා කිරීම.<br>• ගොඩනැගිල්ලේ සවිකර ඇති උපකරණවල ආරක්ෂාවන් පරීක්ෂාව.<br>• සියළු නඩත්තු කටයුතුවලට අදාලව අධ්‍යක්ෂවරයා දැනුවත් කිරීම.<br>• විවිධ උපකරණ ක්‍රියා කරවීම සම්බන්ධව ආරක්ෂාකාරී ක්‍රියාත්මක කිරීමේ ක්‍රම වැඩිදියුණු කිරීම.<br>• අළුත්වැඩියා හා නඩත්තු කටයුතු සඳහා ලබා දී ඇති ආයුධ හා උපකරණ ගබඩා කර තබා ගැනීම.<br>• උපකරණවල හා ගොඩනැගිල්ලේ සිතියම් ගබඩා කර තබා ගැනීම.<br>• අපහරණය කලයුතු භාණ්ඩ ලැයිස්තුගත කිරීම.<br>• ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන වෙනත් රාජකාරී. |

සකස් කළේ :
අත්සන : ..[signature]..........
නම : එච්.ඒ.ර.සෝමරත්න
තනතුර : වැ/බ.අධ්‍යක්ෂ (පාලන 06)
දිනය : ..2014.03.21..........

පරීක්ෂා කළේ :
අත්සන : ..[signature]..........
නම : කේ.ටී.ඩී.සී.විමලසිරි
තනතුර : වැ/බ.නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(පාලන)I.
දිනය : ..2014.03.21..........

අත්සන : ..[signature]..........
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම : වෛද්‍ය පී.ජී.මහීපාල
තනතුර : සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
දිනය : ..2014/03/22..........
නිලමුද්‍රාව : ..........

## ඇමුණුම -02

**සෞඛ්‍ය අමාත්‍යාංශයෙ හි**

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවට අයත්**

**අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන / තාක්ෂණික සේවා ගණයේ**

**තනතුරු වල විවෘත බඳවා ගැනීම් සඳහා අදාල සුදුසුකම්. :-**

| අනු අංකය | තනතුර | සුදුසුකම් |
|---|---|---|
| 01. | ඖෂධ සංයෝජක | 1. (අ) රසායන විද්‍යාව ඇතුළුව විද්‍යා විෂය ධාරාවේ විෂයන් තුනකින් අ.පො.ස (උ.පෙළ) විභාගය එකවර සමත් වීම<br>සහ<br>(ආ) සිංහල/ දෙමළ, ඉංග්‍රීසි භාෂාව , ගණිතය, විද්‍යාව සහ තවත් එක විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවරකදී විෂයයන් හයකින් අ.පො.ස.(සා.පෙළ) විභාගය සමත්වීම.<br>සටහන :<br>i. තෝරාගනු ලබන අයදුම්කරුවන් පූර්ණකාලීන අවුරුදු 01 ක න්‍යායාත්මක හා සීමාවාසික ඖෂධ සංයෝජක පුහුණු පාඨමාලාවට බඳවා ගනු ලැබේ. එලෙස බඳවා ගත් අයදුම්කරුවන් පුහුණුව අවසානයේ පවත්වනු ලබන පරීක්ෂණය සමත්වීමෙන් අනතුරුව ඖෂධ සංයෝජක III වැනි ශ්‍රේණියේ තනතුරේ පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ. |
| 02. | මහජන සෞඛ්‍ය ක්ෂේත්‍ර නිලධාරී | 1. (අ) විද්‍යා විෂය ධාරාවෙන් විෂයන් තුනකින් අ.පො.ස (උ.පෙළ) සමත්ව තිබීම.<br>සහ<br>(ආ) සිංහල/ දෙමළ, ඉංග්‍රීසි භාෂාව , ගණිතය, විද්‍යාව සහ තවත් එක විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවරකදී විෂයයන් හයකින් අ.පො.ස.(සා.පෙළ) විභාගය සමත්වීම.<br>සටහන :<br>i. තෝරාගනු ලබන අයදුම්කරුවන් පූර්ණකාලීන අවුරුදු 01 ක න්‍යායාත්මක හා සීමාවාසික මහජන සෞඛ්‍ය ක්ෂේත්‍ර පුහුණු පාඨමාලාවට බඳවා ගනු ලැබේ. එලෙස බඳවා ගත් අයදුම්කරුවන් පුහුණුව අවසානයේ පවත්වනු ලබන පරීක්ෂණය සමත්වීමෙන් අනතුරුව මහජන සෞඛ්‍ය ක්ෂේත්‍ර නිලධාරී III වැනි ශ්‍රේණියේ තනතුරේ පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ. |

| | | |
|---|---|---|
| 03. | වැඩ මූලික (ජව වෛද්‍ය) | 1. (අ) ශුද්ධ ගණිතය, ව්‍යවහාරික ගණිතය, සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව විෂයන් අතුරින් විෂයයන් දෙකක් ඇතුළුව එක් වරකදී විෂයන් තුනකින් අ.පො.ස.(උ.පෙළ) විභාගය සමත්ව තිබීම.<br>සහ<br>(ආ) සිංහල/ දෙමළ, ඉංග්‍රීසි භාෂාව , ගණිතය, විද්‍යාව සහ තවත් එක විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවරකදී විෂයයන් හයකින් අ.පො.ස.(සා.පෙළ) විභාගය සමත්වීම.<br>සහ<br>2. ඉහත 1 හි සඳහන් අධ්‍යාපන සුදුසුකම් සහිත පහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලින් එක් සුදුසුකමක් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් විභාග කුසලතා අනුව සුදුසුකම් පරීක්ෂා කර බලා වැඩමූලික (ජව වෛද්‍ය) III වැනි ශ්‍රේණියට පත්කරනු ලැබේ.<br>(අ) (i) මොරටුව විශ්ව විද්‍යාලයේ හා අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික (විදුලි / විද්‍යුත්) ඩිප්ලෝමාව<br>හෝ<br>(ii) ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික (විදුලි/ විද්‍යුත්) ඩිප්ලෝමාව<br>හෝ<br>(iii) ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය මඟින් පිරිනමනු ලබන තාක්ෂණික(විදුලි/ විද්‍යුත්) ඩිප්ලෝමාව<br>හෝ<br>(iv) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු(විදුලි/ විද්‍යුත්) ඩිප්ලෝමාව<br>හෝ<br>(v) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ 1 වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම<br><br>සටහන :<br>i. ඉහත 1 (අ) සහ (ආ) හි අධ්‍යාපන සුදුසුකම් මත තෝරාගනු ලබන අයදුම්කරුවන් පූර්ණකාලීන අවුරුදු 01 ක න්‍යායාත්මක හා සීමාවාසික වැඩමූලික (ජව වෛද්‍ය) පුහුණු පාඨමාලාවට බඳවා ගනු ලැබේ. එලෙස බඳවා ගත් අයදුම්කරුවන් පුහුණුව අවසානයේ පවත්වනු ලබන පරීක්ෂණය සමත්වීමෙන් අනතුරුව වැඩමූලික (ජව වෛද්‍ය) III වැනි ශ්‍රේණියේ තනතුරේ පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ |

| | | |
|---|---|---|
| 04. | විකලාංග වැඩපල කාර්මික ශිල්පී | 1. (අ) භෞතික විද්‍යාව ඇතුළු විද්‍යා විෂයයන් තුනකින් අ.පො.ස (උ.පෙළ) විභාගය එකවර සමත්ව තිබීම.<br>සහ<br>(ආ) සිංහල/ දෙමළ, ඉංග්‍රීසි භාෂාව , ගණිතය, විද්‍යාව සහ තවත් එක විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවරකදී විෂයයන් හයකින් අ.පො.ස.(සා.පෙළ) විභාගය සමත්වීම.<br>සහ<br>2. ඉහත 1 හි සඳහන් අධ්‍යාපන සුදුසුකම් සහිත පහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලින් එක් සුදුසුකමක් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් විභාග කුසලතා අනුව සුදුසුකම් පරීක්ෂා කර බලා විකලාංග වැඩපල කාර්මික ශිල්පී III වැනි ශ්‍රේණියට පත්කරනු ලැබේ.<br>(අ) (i) ජාතික අධ්‍යුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු විද්‍යා (විදුලි/ විද්‍යුත්) ඩිප්ලෝමාව<br>හෝ<br>(ii) විවෘත විශ්ව විද්‍යාලය මඟින් පිරිනමනු ලබන තාක්ෂණික(විදුලි/ විද්‍යුත්) ඩිප්ලෝමාව<br>හෝ<br>(iii) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු(විදුලි/ විද්‍යුත්) ඩිප්ලෝමාව<br>හෝ<br>තනතුරට අදාළව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය 5 හෝ 6 මට්ටමට නොඅඩු මට්ටමක (NVQ5 හෝ NVQ 6) ලබා තිබීම. |
| 05. | ශ්‍රවණවේදී කාර්මික ශිල්පී | 1. (අ) භෞතික විද්‍යාව ඇතුළු විද්‍යා විෂයයන් තුනකින් අ.පො.ස (උ.පෙළ) විභාගය එකවර සමත්ව තිබීම.<br>සහ<br>(ආ) සිංහල/ දෙමළ, ඉංග්‍රීසි භාෂාව , ගණිතය, විද්‍යාව සහ තවත් එක විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවරකදී විෂයයන් හයකින් අ.පො.ස.(සා.පෙළ) විභාගය සමත්වීම.<br>සටහන :<br>i. තෝරාගනු ලබන අයදුම්කරුවන් පූර්ණකාලීන අවුරුදු 02 ක න්‍යායාත්මක හා සීමාවාසික ශ්‍රවණවේදී කාර්මික ශිල්පී පුහුණු පාඨමාලාවට බඳවා ගනු ලැබේ. එලෙස බඳවා ගත් අයදුම්කරුවන් පුහුණුව අවසානයේ පවත්වනු ලබන පරීක්ෂණය සමත්වීමෙන් අනතුරුව ශ්‍රවණවේදී කාර්මික ශිල්පී III වැනි ශ්‍රේණියේ තනතුරේ පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ. |

| | | |
|---|---|---|
| 06. | සිනමා තාක්ෂණ ශිල්පී | 1. (අ) ශුද්ධ ගණිතය, ව්‍යාවහාරික ගණිතය, සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව විෂයන් අතුරින් විෂයයන් දෙකක් ඇතුළුව එක් වරකදී විෂයන් තුනකින් අ.පො.ස.(උ.පෙළ) විභාගය සමත්ව තිබීම.<br><br>සහ<br><br>(ආ) සිංහල/ දෙමළ, ඉංග්‍රීසි භාෂාව , ගණිතය, විද්‍යාව සහ තවත් එක විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවරකදී විෂයයන් හයකින් අ.පො.ස.(සා.පෙළ) විභාගය සමත්වීම.<br><br>සහ<br><br>2. ඉහත 1 හි සඳහන් අධ්‍යාපන සුදුසුකම් සහිත පහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලින් එක් සුදුසුකමක් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් විභාග කුසලතා අනුව සුදුසුකම් පරීක්ෂා කර බලා සිනමා තාක්ෂණ ශිල්පී III වැනි ශ්‍රේණියට පත්කරනු ලැබේ.<br><br>(අ) (i) ජාතික අධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු විද්‍යා (විදුලි/ විද්‍යුත්) ඩිප්ලෝමාව<br><br>හෝ<br><br>(ii) විවෘත විශ්ව විද්‍යාලය මඟින් පිරිනමනු ලබන තාක්ෂණික(විදුලි/ විද්‍යුත්) ඩිප්ලෝමාව<br><br>හෝ<br><br>(iii) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු(විදුලි/ විද්‍යුත්) ඩිප්ලෝමාව<br><br>හෝ<br><br>තනතුරට අදාළව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය 5 හෝ 6 මට්ටමට නොඅඩු මට්ටමක (NVQ5 හෝ NVQ 6) ලබා තිබීම. |

| 07. | විද්‍යුත් නඩත්තු කාර්මික ශිල්පී | 1. (අ) විද්‍යා විෂය ධාරාවෙන් විෂයන් තුනකින් අ.පො.ස.(උ.පෙළ) විභාගය සමත්ව තිබීම.<br>සහ<br>(ආ) සිංහල/ දෙමළ, ඉංග්‍රීසි භාෂාව , ගණිතය, විද්‍යාව සහ තවත් එක විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවරකදී විෂයයන් හයකින් අ.පො.ස.(සා.පෙළ) විභාගය සමත්වීම.<br>සහ<br>2. ඉහත 1 හි සඳහන් අධ්‍යාපන සුදුසුකම් සහිත පහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලින් එක් සුදුසුකමක් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් විභාග කුසලතා අනුව සුදුසුකම් පරීක්ෂා කර බලා විද්‍යුත් නඩත්තු කාර්මික ශිල්පී III වැනි ශ්‍රේණියට පත්කරනු ලැබේ.<br>(ඇ) (i) මොරටුව විශ්ව විද්‍යාලයේ හා අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව<br>හෝ<br>(ii) ජාතික අධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාර්ය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමාව<br>හෝ<br>(iii) විවෘත විශ්ව විද්‍යාලය මඟින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව<br>හෝ<br>(iv) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව<br>හෝ<br>(v) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව.<br>හෝ<br>තනතුරට අදාළව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය 5 හෝ 6 මට්ටමට නොඅඩු මට්ටමක (NVQ5 හෝ NVQ 6) ලබා තිබීම. |
|---|---|---|

සකස් කළේ :
අත්සන : ..................
නම : එච්.ඒ.ඊ.සෝමරත්න
තනතුර : වැ/බ.අධ්‍යක්ෂ (පාලන 06)
දිනය : 2014.03.21

පරීක්ෂා කළේ :
අත්සන : ..................
නම : කේ.ටී.බී.ඒ.විමලසිරි
තනතුර : වැ/බ.නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(පාලන)1.
දිනය : 2014.03.21

අත්සන : ..................
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම : වෛද්‍ය පී.ජී.මහීපාල
තනතුර : සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
දිනය : 2014/03/2
නිලමුද්‍රාව : ..................

ඇමුණුම - 03
සෞඛ්‍ය අමාත්‍යාංශයෙ හි
ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවට අයත්
අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන / තාක්ෂණික සේවා ගණයේ
**තනතුරු වල සීමිත බඳවා ගැනීම් සඳහා අදාල සුදුසුකම්.**

| අනු අංකය | තනතුර | සුදුසුකම් |
|---|---|---|
| 01. | ඖෂධ සංයෝජක | අධ්‍යාපන සුදුසුකම්:-<br>සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය යන විෂයයනට සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස.(සා.පෙළ) විභාගය විෂයන් හය (06) කින් සමත් වීම.<br>පළපුරුද්ද :<br>ප්‍රාථමික හෝ ඉන් ඉහල සේවා ගණයක ස්ථිර,දෙපාර්තමේන්තුගත තනතුරක අදාල ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 10ක සක්‍රීය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම. |
| 02. | මහජන සෞඛ්‍ය ක්ෂේත්‍ර නිලධාරී | අධ්‍යාපන සුදුසුකම්:-<br>සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය යන විෂයයනට සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස.(සා.පෙළ) විභාගය විෂයන් හය (06) කින් සමත් වීම.<br>පළපුරුද්ද :<br>ප්‍රාථමික හෝ ඉන් ඉහල සේවා ගණයක ස්ථිර,දෙපාර්තමේන්තුගත තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 10ක සක්‍රීය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම. |
| 03 | වැඩ මූලික (ජීව වෛද්‍ය) | අධ්‍යාපන සුදුසුකම්:-<br>(I) පුහුණු ශ්‍රේණිය<br>සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය යන විෂයයනට සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස.(සා.පෙළ) විභාගය විෂයන් හය (06) කින් සමත් වීම.<br>පළපුරුද්ද:<br>විදුලි වෛද්‍ය යාන්ත්‍රික තනතුරක විදුලි වෛද්‍ය යාන්ත්‍රික ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 10ක සක්‍රීය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම<br>හෝ<br>(II). III ශ්‍රේණිය<br>අධ්‍යාපන සුදුසුකම්:-<br>සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය යන විෂයයනට සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස.(සා.පෙළ) විභාගය විෂයන් හය (06) කින් සමත් වීම.<br>වෘත්තීය සුදුසුකම්:<br>තනතුරට අදාළ 7.2.2.2හි සඳහන් වෘත්තීය සුදුසුකමක් ලබා තිබීම.<br>පළපුරුද්ද :<br>ප්‍රාථමික හෝ ඉන් ඉහල සේවා ගණයක ස්ථිර,දෙපාර්තමේන්තුගත තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම. |

| | | |
|---|---|---|
| 04. | විකලාංග වැඩපල කාර්මික ශිල්පී | **අධ්‍යාපන සුදුසුකම්:-**<br>සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය යන විෂයයනට සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස.(සා.පෙළ) විභාගය විෂයන් හය (06) කින් සමත් වීම.<br>**වෘත්තීය සුදුසුකම්:**<br>තනතුරට අදාළ 7.2.2.2හි සඳහන් වෘත්තීය සුදුසුකමක් ලබා තිබීම.<br>**පළපුරුද්ද:**<br>ප්‍රාථමික හෝ ඉන් ඉහල සේවා ගණයක ස්ථිර දෙපාර්තමේන්තුගත තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 5ක සක්‍රීය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම |
| 05. | ශ්‍රවණවේදී කාර්මික ශිල්පී | **අධ්‍යාපන සුදුසුකම්:-**<br>සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය යන විෂයයනට සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස.(සා.පෙළ) විභාගය විෂයන් හය (06) කින් සමත් වීම.<br>**පළපුරුද්ද :**<br>ප්‍රාථමික හෝ ඉන් ඉහල සේවා ගණයක ස්ථිර,දෙපාර්තමේන්තුගත තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 10ක සක්‍රීය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම. |

සකස් කළේ :
අත්සන : [signature]
නම : එච්.ඒ.ඊ.සෝමරත්න
තනතුර : වැ/බ.අධ්‍යක්ෂ (පාලන 06)
දිනය : 2014.03.21

පරීක්ෂා කළේ :
අත්සන : [signature]
නම : කේ.ඒ.ඩී.සී.විමලසිරි
තනතුර : වැ/බ.නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(පාලන)I.
දිනය : 2014.03.21

අත්සන : [signature]
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම : වෛද්‍ය පී.ජ.මහිපාල
තනතුර : සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
දිනය : 2014/03/23
නිලමුද්‍රාව :

## ඇමුණුම - 04

**සෞඛ්‍ය අමාත්‍යාංශයෙ හි**

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවට අයත්**

**අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන / තාක්ෂණික සේවා ගණය**

**01.** **විභාගයේ නම** : අධීක්ෂණ කළමනාකරණ සහකාර තනතුර (MN -3-2006(ඒ)) (විවෘත) සඳහා වන බඳවා ගැනීමේ ලිඛිත පරීක්ෂණය

**02.** **විභාගය පිළිබඳ විස්තර** :

| විෂයයන් | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| 2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | 100 | 40% |

**03.** **පවත්වන බලධරයා** : සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින් හා නම් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින්

**04.** **පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග** : තනතුරු වල පුරප්පාඩු ඇති වීම මත

**05.** **විභාගය සඳහා වන විෂය නිර්දේශය** :

| විෂයයන් | විෂය |
|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | සේවයේ රාජකාරි සඳහා අපේක්ෂකයෙකුගේ යෝග්‍යතාව හා හැකියාව පරීක්ෂා කර බැලීමට මෙම ප්‍රශ්න පත්‍රය සකස් කරනු ඇත. |
| 2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | ඒ ඒ තනතුරට අදාල තාක්ෂණික දැනුම මැන බැලීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රය සකස් කරනු ලැබේ. |

**සටහන:**

මෙම විභාගය තරඟ විභාගයක් වුවද එක් එක් විෂයය සඳහා වෙන් කර ඇති ලකුණු වලින් යටත් පිරිසෙයින් 40% වත් අපේක්ෂකයා විසින් ලබා ගතයුතුය. තරඟ විභාගය සඳහා වෙන්කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි, ලබාගත් ලකුණු අනුපිළිවෙල අනුගමනය කරමින් බඳවා ගනු ලැබේ.

සකස් කළේ :
අත්සන : H.P.U. Somarath (signature)
නම : එච්.ඒ.ට්.සෝමරත්න
තනතුර : වැ/බ.අධ්‍යක්ෂ (පාලන 06)
දිනය : 2014.08.21

පරීක්ෂා කළේ :
අත්සන : (signature)
නම : කේ.වී.ඩී.ශී.විමලසිරි
තනතුර : වැ/බ.නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(පාලන)1.
දිනය : 2014.03.21

අත්සන : (signature)
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම : වෛද්‍ය පී.ජී.මහීපාල
තනතුර : සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
දිනය : 2014/03/22
නිලමුද්‍රාව :

## ඇමුණුම - 05

### සෞඛ්‍ය අමාත්‍යාංශයෙ හි
### ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවට අයත්
### අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන / තාක්ෂණික සේවා ගණය

**01.** **විභාගයේ නම** : අධීක්ෂණ කළමනාකරණ සහකාර තනතුර (MN -3-2006(ඒ)) (සීමිත) සඳහා වන බඳවා ගැනීමේ ලිඛිත පරීක්ෂණය

**02.** **විභාගය පිළිබඳ විස්තර** :

**ලිඛිත පරීක්ෂණ :**

| විෂයයන් | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1 බුද්ධි පරීක්ෂණය | පැය 02 යි | 100 | 40% |
| 2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 01 1/2 යි | 100 | 40% |

**03.** **පවත්වන බලධරයා :** සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින් හා නම් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින්

**04.** **පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග :** තනතුරු වල පුරප්පාඩු ඇති වීම මත

**05.** **විභාගය සඳහා වන විෂය නිර්දේශය :**

**ලිඛිත පරීක්ෂණ**

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | සේවයේ රාජකාරි සඳහා අපේක්ෂකයෙකුගේ යෝග්‍යතාව හා හැකියාව පරීක්ෂා කර බැලීමට මෙම ප්‍රශ්න පත්‍රය සකස් කරනු ඇත. |
| 2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | ඒ ඒ තනතුරට අදාල තාක්ෂණික දැනුම මැන බැලීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රය සකස් කරනු ලැබේ. |

**සටහන:**

එක් එක් පරීක්ෂණය සඳහා වෙන් කර ඇති ලකුණු වලින් යටත් පිරිසෙයින් 40% ක් අපේක්ෂකයා විසින් ලබා ගත යුතුය. තරඟ විභාගය සඳහා වෙන්කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි, ලබාගත් ලකුණු අනුපිළිවෙල අනුගමනය කරමින් බඳවා ගනු ලැබේ.

සකස් කළේ :
අත්සන : H.A.R. Somaratne
නම : එච්.ඒ.ආර්.සෝමරත්න
තනතුර : වැ/බ.අධ්‍යක්ෂ (පාලන 06)
දිනය : 2014.03.21

පරීක්ෂා කළේ :
අත්සන : ...........
නම : කේ.වී.ඩී.සිරිමලසිරි
තනතුර : වැ/බ.නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(පාලන)1.
දිනය : 2014.03.21

අත්සන : ...........
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම : වෛද්‍ය පී.ජී.මහීපාල
තනතුර : සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
දිනය : 2014/03/23
නිලමුද්‍රාව : ...........

## ඇමුණුම - 06

**සෞඛ්‍ය අමාත්‍යාංශයෙ හි**

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවට අයත්**

**අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන / තාක්ෂණික සේවා ගණය**

**01.** **විභාගයේ නම** : අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවයේ MN- 03 2006 ඒ තනතුරු සඳහා වන පළමු දෙපාර්තමේන්තු පරීක්ෂණය

**02.** **විභාගය පිළිබඳ විස්තර** :

| ප්‍රශ්න පත්‍රය | කාලය | ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1.විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රය | පැය 03යි | 100 | 40 % |
| 2. ප්‍රායෝගික පරීක්ෂණය | පැය 01 1/2 | 100 | 40 % |

**03.** **පවත්වන බලධරයා :** සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින්

**04.** **පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග :** අවශ්‍යතාවය පරිදි වසරකට එක් වරක්

**05.** **විභාගය සඳහා වන විෂය නිර්දේශය :**

| ප්‍රශ්ණ පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| විෂයානු බද්ධ ප්‍රශ්න පත්‍රය | සියළුම තනතුරු සඳහා දෙපාර්තමේන්තුවේ තාක්ෂණික කටයුතුවලට අදාළ කරුණු වලට අමතරව දෙපාර්තමේන්තු රෙගුලාසි, පනත් ක්‍රියා පිළිවෙත් ආදියට අදාළව හා රෝගී සත්කාර සේවාව හා ප්‍රජා සෞඛ්‍ය සේවාවට අදාළව පවතින චක්‍රලේඛ හා උපදෙස්. |
| ප්‍රායෝගික පරීක්ෂණය | විෂය ක්ෂෙත්‍රයට අදාළව හැකියාවන් හා ක්‍රියා කාරකම් හා බැඳුනු ප්‍රායෝගික පරීක්ෂණයකි. |

(පැරණි ව්‍යවස්ථාවේ (1426/34 හා 2006.01.06 දිනැති)6.3.1 (ඇ) හි වෘත්තීය සුදුසුකම් යටතේ නියමිත තාක්ෂණ සුදුසුකම්වලින් එක් සුදුසුකමක් ලබා සිටින නිලධාරීන්ට පළමු දෙපාර්තමේන්තු පරීක්ෂණයේ තාක්ෂණ විෂයයන්ගෙන් නිදහස්වීමට අයිතිවාසිකම් ඇත. )

සකස් කළේ :
අත්සන : ..H.A.R. Sumathi..........
නම : එච්.ඒ.ර්.සෝමරත්න
තනතුර : වැ/බ අධ්‍යක්ෂ (පාලන 06)
දිනය : ..2014.03.21..........

පරීක්ෂා කළේ :
අත්සන : ..........
නම : කේ.වී.ඩී.සී.විමලසිරි
තනතුර : වැ/බ.නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(පාලන)1.
දිනය : ..2014.03.21..........

අත්සන : ..........
(දෙපාර්තමේන්තු ප්‍රධානී)
නම : වෛද්‍ය පී.ජී.මහීපාල
තනතුර : සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
දිනය : ....2014/03/23..........
නිලමුද්‍රාව : ..........

## ඇමුණුම - 07

### සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි

### ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවට අයත්

### අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන / තාක්ෂණික සේවා ගණය

01. විභාගයේ නම : අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවයේ MN- 03 2006 ඒ තනතුරු සඳහා වන දෙවන දෙපාර්තමේන්තු පරීක්ෂණය

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1.විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රය | පැය 03යි | 100 | 40 % |
| 2. ප්‍රායෝගික පරීක්ෂණය | පැය 01 1/2 | 100 | 40 % |

03. පවත්වන බලධරයා: සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින්

04. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්ණ පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| විෂයානු බද්ධ ප්‍රශ්න පත්‍රය | සියළුම තනතුරු සඳහා දෙපාර්තමේන්තුවේ තාක්ෂණික කටයුතුවලට අදාළ කරුණු වලට අමතරව දෙපාර්තමේන්තු රෙගුලාසි, පනත් ක්‍රියා පිළිවෙත් ආදියට අදාළව හා රෝගී සත්කාර සේවාව හා ප්‍රජා සෞඛ්‍ය සේවාවට අදාළව පවතින චක්‍රලේඛ හා උපදෙස්. |
| ප්‍රායෝගික පරීක්ෂණය | විෂය ක්ෂෙත්‍රයට අදාළව හැකියාවන් හා ක්‍රියා කාරකම් හා බැඳුණු ප්‍රායෝගික පරීක්ෂණයකි. |

සකස් කළේ :
අත්සන : [signature]
නම : එච්.ඒ.ඊ.සෝමරත්න
තනතුර : වැ/බ අධ්‍යක්ෂ (පාලන 06)
දිනය : 2014.03.21

පරීක්ෂා කළේ :
අත්සන : [signature]
නම : කේ.වී.ඩී.සී.විමලසිරි
තනතුර : වැ/බ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(පාලන)1.
දිනය : 2014.03.21

අත්සන : [signature]
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම : වෛද්‍ය පී.ජී.මහීපාල
තනතුර : සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
දිනය : 2014/03/28
නිලමුද්‍රාව :